# Sinhala Studies Symposium - 2019

Sinhala Studies: Past, Present and future

Department of Sinhala | University of Colombo

www.arts.cmb.ac.lk/sinhala sinhalaconference2019@gmail.com

Tele/ Fax 0094 112 500 453


*2019. 07. 25*

……………………………

……………………………

…………………………

පීඨාධිපතිතුමා/තුමිය,

අංශාධිපතිතුමා/ තුමිය,

**නවවන සිංහල අධ්‍යයන පර්යේෂණ සැසිය - 2019**

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශය මගින් නවවන වරට පවත්වනු ලබන වාර්ෂික පර්යේෂණ සැසිය **"සිංහල අධ්‍යයනය, එදා, අද සහ හෙට"** යන තේමාව යටතේ 2019 **ඔක්තෝබර් මස 17 සහ 18** යන දෙදින පැවැත්වීමට කටයුතු යොදා ඇත.

මෙවර වාර්ෂික පර්යේෂණ සැසිය තුළ, සමාජ හා මානවවිද්‍යා අධ්‍යයන ක්ෂේත්‍රයේ බොහෝ විෂය පථයන් සිංහල අධ්‍යයන ශාස්ත්‍රීය අවකාශය සමඟ සම්මුඛ වන අවස්ථාවන් කෙරේ අවධානය යොමුකිරීමට අපේක්ෂිත බැවින්, සමාජවිද්‍යා, මානවවිද්‍යා, දේශපාලනවිද්‍යා ඇතුළු පෘථුල විෂය කලාප ඔස්සේ විහිදුණු පර්යේෂණ කෙරෙහි ප්‍රමුඛතාවක් දැක්වීමට අපි අදහස් කරමු.

ඒ අනුව, පහත අනුතේමා ඔස්සේ සිංහල සහ ඉංග්‍රීසි යන භාෂාද්වයෙන් ම පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමට හැකි ය.

භාෂාව, ව්‍යාකරණ හා වාග්විද්‍යාව
සාහිත්‍ය අධ්‍යයන
ප්‍රාචීන අධ්‍යයන
සංස්කෘතික සහ ජනශ්‍රැති අධ්‍යයන
සමාජ- මානවවිද්‍යා අධ්‍යයන
සාහිත්‍ය විචාර
නාට්‍ය සහ රංගකලා
පරිවර්තන සාහිත්‍යය
ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අධ්‍යයන
ශිලාලිපි හා පුරාක්ෂර විද්‍යාව

වාචික පර්යේෂණ පත්‍රිකා සැසි සහ පෝස්ටර් ඉදිරිපත් කිරීම් යන අංශ ද්වයෙන් ම පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කළ හැකි අතර සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා දෙකෙන් ම ඉදිරිපත් කිරීම් සිදු කළ හැකි ය.

ඔබගේ විස්තෘත සාරසංක්ෂේප **2019 අගෝස්තු 20** වන දිනට ප්‍රථම sinhalaconference2019@gmail.com යන විද්‍යුත් ලිපිනයට හෝ https://arts.cmb.ac.lk/sinhala/ යන වෙබ් අඩවියට ලැබීමට සලස්වන්න. සාරසංක්ෂේප පිළිබඳ මාර්ගෝපදේශ මේ සමඟ අමුණා ඇත.

වැඩි විස්තර පහත සඳහන් අයගෙන් ලබාගත හැකි ය.


**කථිකාචාර්ය අචින්ත්‍ය බණ්ඩාර (පර්යේෂණ සැසි ප්‍රධානී)**

(94) 711 488 428

achinthabandara@sinh@cmb.ac.lk

**සහකාර කථිකාචාර්ය සුපිපි තනුජා හර්ෂණී (පර්යේෂණ සැසි සම්බන්ධීකාරක)**

(94) 714 836 858

supipiharshaniuoc@gmail.com


සිංහල භාෂාව, සාහිත්‍යය හා ඊට සම්බන්ධ අධ්‍යයනයන් ඔස්සේ පර්යේෂණ කටයුතු සිදු කිරීම ප්‍රවර්ධනය කිරීමත්, ජ්‍යෙෂ්ඨ හා කනිෂ්ඨ විද්‍යාර්ථීන්හට පර්යේෂණ ඉදිරිපත් කිරීම සඳහා දිරි දීමත් අරමුණු කර ගත් මෙම ශාස්ත්‍රීය පර්යේෂණ සැසිය සඳහා පර්යේෂණ පත්‍රිකා හෝ පෝස්ටර් ඉදිරිපත් කිරීමෙන් සහභාගි වන ලෙස ඇරයුම් කර සිටිමු.

ස්තූතියි,

මෙයට විශ්වාසී,

| | |
|---|---|
| **කථිකාචාර්ය අචින්ත්‍ය බණ්ඩාර** | **මහාචාර්ය සඳගෝමි කෝපරහේවා** |
| **පර්යේෂණ සැසි ප්‍රධානී** | **අංශ ප්‍රධාන \| සිංහල අධ්‍යයනාංශය** |

# නවවන සිංහල අධ්‍යයන පර්යේෂණ සැසිය - 2019

**වැදගත් දින**

සාරසංක්ෂේප ඉදිරිපත් කිරීම - **2019 අගෝස්තු** 20

තෝරාගැනීම් පිළිබඳ දැනුම්දීම - **2019 අගෝස්තු 30**

පූර්ව ලියාපදිංචි වීම - **2019 සැප්තැම්බර් 30**

සම්මන්ත්‍රණ දිනය - **2019 ඔක්තෝබර් 17 - 18**

**සාරසංක්ෂේප ඉදිරිපත් කිරීමේ මාර්ගෝපදේශ**

***වාචික ඉදිරිපත් කිරීම්***

විස්තෘත සාරසංක්ෂේපයඃ වචන 1200 නො වැඩි පිටු පහක උපරිමයකට යටත් විය යුතු අතර, පහත සඳහන් කොටස්වලින් සමන්විත විය යුතු ය.

1. මාතෘකාව
2. කෙටි සාරසංක්ෂේපය
3. ප්‍රමුඛ පද
4. හැඳින්වීම (පර්යේෂණ ගැටලු, පර්යේෂණ ප්‍රශ්න සහ අරමුණු)
5. සාහිත්‍ය විමර්ශනය
6. පර්යේෂණ ක්‍රමවේදය
7. ප්‍රතිඵල
8. සාකච්ඡාව
9. නිගමනය
10. මූලාශ්‍රය හාවර්ඩ් ශෛලිය

අකුරු ප්‍රමාණය FM Abhaya, Unicode හෝ Times New Roman විය යුතු අතර, අකුරු ප්‍රමාණය 12 සහ තීර පරතරය 1.5 විය යුතු ය.
ඉදිරිපත් කිරීම සඳහා විනාඩි 20 ක කාලයක් ලබා දෙනු ඇත. පසුව විනාඩි 10 කින් සමන්විත සාකච්ඡා සැසියක් පැවැත්වෙනු ඇත.

**පෝස්ටර් ඉදිරිපත් කිරීම්**

ප්‍රමාණයඃ අඟල් 46.5 ක් පළල අඟල් 65 ක් උසැති, පුවරුවලට ගැළපෙන ලෙස පෝස්ටර් සකස් කළ යුතු ය. (ඔබගේ පෝස්ටර් පර්යේෂණ සැසියේ සංවිධායක මණ්ඩලය විසින් මුද්‍රණය කර දෙනු ලැබේ).